AL/2022(2023)/29/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

11721

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා තොරතුරු රැගෙන යන සන්නිවේදන මූලිකාංගය කුමක් ද?
(1) අත්දැකීම් පසුතලය (2) සංදේශය (3) ප්‍රතිපෝෂණය
(4) නාලිකාව (5) සන්දර්භය

**2.** ජන සන්නිවේදනයේදී බහුලව සිදුවන්නේ,
(1) චක්‍රාකාර සන්නිවේදනයකි. (2) ඒක මාර්ගික සන්නිවේදනයකි.
(3) ද්වි-මාර්ගික සන්නිවේදනයකි. (4) පුද්ගල බද්ධ සන්නිවේදනයකි.
(5) ධනාත්මක සන්නිවේදනයකි.

**3.** තොරතුරු ලබාගැනීමේ අයිතිය මුල්වරට නීතිගත කළ රට කුමක් ද?
(1) ස්වීඩනය (2) ඇමරිකාව (3) ප්‍රංශය
(4) ඉන්දියාව (5) ජර්මනිය

**4.** ශ්‍රවණය, භාෂණය, අනුකරණය හා උච්චාරණය සෘජුවම අදාළ වන්නේ,
(1) ලිඛිත සන්නිවේදනයටයි. (2) වාචික සන්නිවේදනයටයි.
(3) කථන සන්නිවේදනයටයි. (4) විධිමත් සන්නිවේදනයටයි.
(5) ශ්‍රව්‍ය සන්නිවේදනයටයි.

**5.** මානව වර්ගයාගේ අස්පර්ශණීය සංස්කෘතික උරුමයක් ලෙස යුනෙස්කෝ සංවිධානය මගින් ප්‍රථමවරට නම් කරන ලද දේශීය කලාව කුමක් ද?
(1) කෝලම් (2) සොකරි (3) රූකඩ (4) නාඩගම් (5) අභිචාර විධි

**6.** සන්නිවේදනය පුද්ගල සම්බන්ධතා ප්‍රසාරණය කරන, එක් දේශයකට පමණක් සීමා නොවන හා කාලය ද අතික්‍රමණය කරන්නකි. මෙම අදහස දක්වන ලද්දේ,
(1) චාල්ස් කූලි ය. (2) විල්බර් ශ්‍රාම් ය. (3) ෂැනන් හා වීවර් ය.
(4) චාල්ස් ඔස්ගුඩ් ය. (5) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.

**7.** ලේඛක මතය හා අනන්‍යතාව පුවත්පතක ප්‍රමුඛ වශයෙන් ඉස්මතු කරන අංගය කුමක් ද?
(1) ප්‍රවෘත්ති (2) විශේෂාංග ලිපි
(3) තීරු ලිපි (4) දැන්වීම් පිටපත
(5) සම්මුඛ සාකච්ඡා

**8.** පුවත්පත් මගින් සිදුවන ආචාරධර්ම කඩවීමකදී අගතියට පත් පාර්ශවයට සාධාරණය ඉටුකර ගත හැක්කේ කිනම් ආයතනයෙන් ද?
(1) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය (2) එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
(3) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (4) ශ්‍රී ලංකා කර්තෘ සංසදය
(5) ජනමාධ්‍ය අමාත්‍යාංශය

[ දෙවැනි පිටුව බලන්න

**9.** මානව ආකල්ප හා චර්යා වඩාත් අදාළ වන්නේ,

(1) කණ්ඩායම් සන්නිවේදනයට ය.
(2) අන්තර් සංස්කෘතික සන්නිවේදනයට ය.
(3) නිර්වාචික සන්නිවේදනයට ය.
(4) අන්තර් පුද්ගල සන්නිවේදනයට ය.
(5) අවිධිමත් සන්නිවේදනයට ය.

**10.** කෝලම් නාට්‍යයේ භාවිත චාරිත්‍ර චාරිත්‍රවලින් වඩාත් පිළිබිඹු වන්නේ,

(1) ජන සම්ප්‍රදායයි.
(2) ව්‍යුහයේ සරලත්වයයි.
(3) සංස්කෘතික සන්දර්භයයි.
(4) තේමාත්මක අන්තර්ගතයයි.
(5) සාම්ප්‍රදායික පිළිවෙතයි.

**11.** තොරතුරු ලබාගැනීමට මෙන්ම ලබා දීමටද ඇති හැකියාව මගින් පෙන්නුම් කරන්නේ සන්නිවේදනය

(1) විවිධාකාර බවයි.
(2) ක්‍රියාපටිපාටියක් බවයි.
(3) ද්වි-මාර්ගික බවයි.
(4) ප්‍රතිපෝෂණයක් සහිත බවයි.
(5) බලපෑම් සහගත බවයි.

**12.** මාධ්‍ය ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගින් ඉටුකරන භූමිකාව කුමක් ද?

(1) දොරටු පාලනය
(2) නියාමනය
(3) මාධ්‍ය විස්තාරණය
(4) ප්‍රතිපෝෂණය
(5) වාරණය

**13.** අර්ථ බාධක යන දුබලතාව ඇතිවීමට පහත සඳහන් කවර අවස්ථාව අදාළ වන්නේ ද?

(1) පණිවිඩය ඉදිරිපත් කිරීම
(2) සංකේත තෝරාගැනීම
(3) ග්‍රාහක භූමිකාව
(4) තාක්ෂණික භාවිතය
(5) ශ්‍රවණ ක්‍රියාවලිය

**14.** නිර්මාණයක මූලික ලක්ෂණය කුමක් ද?

(1) සහජාභ්‍යාසය
(2) විචිත්‍රබව
(3) අපූර්වත්වය
(4) ප්‍රාසාංගිකබව
(5) විවිධත්වය

**15.** ජනමාධ්‍ය විචාරයේදී මුඛ්‍ය වන්නේ,

(1) මාධ්‍යවේදියායි.
(2) සංදේශයයි.
(3) ග්‍රාහකයායි.
(4) මාධ්‍ය සාක්ෂරතාවයි.
(5) අත්දැකීම් පසුතලයයි.

**16.** විභාගය සමත් වීමට නම් විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලෙසත් මාධ්‍ය සමඟ වැඩි කාලයක් ගත නොකරන ලෙසත් ගුරුතුමා සිසුන්ගෙන් ඉල්ලා සිටියේ ය. මෙහිදී සිසුන්ට ලබාදෙන මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ මූලික සාධකය වන්නේ,

(1) ස්වකේන්ද්‍රයයි.
(2) ඥාන ව්‍යුහයයි.
(3) කුසලතායි.
(4) විශ්ලේෂණයයි.
(5) ඇගයීමයි.

**17.** පුවත්පතක සංස්කාරකවරයෙකු වූ රාජරත්න මහතා විශ්‍රාම ගත් පසු ඔහු එම පුවත්පතේම ඔම්බුඩ්ස්මන්වරයා ලෙස පත් කරනු ලැබිය. ඔහුගේ නව භූමිකාවට අදාළ වන්නේ,

(1) පූර්ව නියාමනයයි.
(2) සහ නියාමනයයි.
(3) ව්‍යවස්ථාපිත නියාමනයයි.
(4) ස්වයං නියාමනයයි.
(5) අභ්‍යන්තර නියාමනයයි.

**18.** බ්‍රිතාන්‍යය 1927දී රාජකීය ප්‍රඥප්තිය හඳුන්වා දෙන ලද්දේ කුමක් සඳහා ද?

(1) ශ්‍රී ලංකාවට ගුවන්විදුලිය හඳුන්වාදීමට
(2) ඉන්දියාවට ගුවන්විදුලිය හඳුන්වාදීමට
(3) බ්‍රිතාන්‍යය තුළ රූපවාහිනිය හඳුන්වාදීමට
(4) මහජන සේවා මාධ්‍ය සංකල්පය හඳුන්වාදීමට
(5) ප්‍රවෘත්ති ආචාරධර්ම හඳුන්වාදීමට

**19.** විල්බර් ශ්‍රාම්ට අනුව ජනමාධ්‍ය සතු භූමිකා ත්‍රිත්වයකි. ඒවා කවරේ ද?

(1) ආරක්ෂකයෙක්, දොරටුපාලකයෙක් හා මණ්ඩපයක්
(2) මණ්ඩපයක්, ගුරුවරයෙක් හා විචාරකයෙක්
(3) විචාරකයෙක්, ආරක්ෂකයෙක් හා දොරටුපාලකයෙක්
(4) දොරටුපාලකයෙක්, මණ්ඩපයක් හා ගුරුවරයෙක්
(5) ගුරුවරයෙක්, ආරක්ෂකයෙක් හා මණ්ඩපයක්

20. සමීක්ෂණයකදී ප්‍රශ්නාවලිය මගින් ලබාගන්නා දත්ත
(1) ප්‍රාථමික අමු දත්ත වේ.
(2) ප්‍රමාණාත්මක ද්විතීයික දත්ත වේ.
(3) ගුණාත්මක ද්විතීයික දත්ත වේ.
(4) ද්විතීයික අමු දත්ත වේ.
(5) ප්‍රාථමික හා ද්විතීයික දත්ත වේ.

21. ආරක්ෂණ තොරතුරු සහ ආපදා තොරතුරු පිළිබඳ පෙර දැනුවත් කිරීම අයත් වන්නේ,
(1) සුපරීක්ෂණයටයි. (2) පෙළඹවීමටයි. (3) අර්ථකථනයටයි.
(4) සහසම්බන්ධයටයි. (5) සමාජානුයෝජනයටයි.

22. HUB සහ ඔස්ගුඩ්-ශ්‍රාම් සන්නිවේදන ආකෘති මගින් ගම්‍ය කෙරෙන පොදු සාධකය කුමක් ද?
(1) දොරටුපාලනය (2) නියාමනය
(3) අත්දැකීම් පසුතලය (4) ප්‍රතිපෝෂණය
(5) බලපෑම

23. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) විධිමත් සන්නිවේදනය සඳහා ලිඛිත සන්නිවේදනය වඩාත් යෝග්‍ය වේ.
(2) කථන සන්නිවේදනය බොහෝ විට මුහුණට මුහුණලා සිදු කෙරේ.
(3) වාචික සන්නිවේදනයට වැඩි කාලයක් ගත නොවේ.
(4) අවිධිමත් සන්නිවේදනය සඳහා බහුල වශයෙන් කථන සන්නිවේදනය භාවිත වේ.
(5) ලිඛිත හා කථන සන්නිවේදනය වාචික සන්නිවේදනයට අයත් නොවේ.

24. චිත්‍රපටයක ප්‍රධාන චරිතය නඩුවකින් ජය ගෙන උසාවියෙන් පිටතට එන දර්ශනය රූගත කිරීමේදී, එම චරිතයට ප්‍රබලත්වයක් ආරෝපණය කිරීමට අධ්‍යක්ෂවරයා යොදා ගත යුතු රූප රාමුව / කැමරා කෝණය වන්නේ,
(1) දුර රූපය යි. (2) සමීප රූපය යි. (3) උඩුකුරු දැක්ම යි.
(4) ඉතා දුර රූපය යි. (5) යටිකුරු දැක්ම යි.

25. මාධ්‍ය සාක්ෂරතාව සඳහා මූලිකවම සපුරාලිය යුතු අවශ්‍යතාව වන්නේ, සංදේශය
(1) ඇගයීමයි. (2) විශ්ලේෂණයයි. (3) අර්ථකථනයයි.
(4) සංශ්ලේෂණයයි. (5) ග්‍රහණයයි.

26. මාධ්‍ය අධ්‍යයන විෂය හැදෑරීමේදී **අවම** වැදගත්කමක් දක්වන්නේ කුමක් ද?
(1) මාධ්‍ය සාක්ෂරතාව (2) විචාරශීලී මාධ්‍ය පරිහරණය
(3) ලේඛන හැකියාව (4) මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ අවබෝධය
(5) භාෂා භාවිතයේ ප්‍රවීණත්වය

27. ඉන්දියාවේ නව අගමැතිවරයා පිළිබඳ ලිපියක් අන්තර්ජාලයෙහි දකින රවීට ඒ ඔස්සේ ගොස් ඔහුගේ පාසල, විශ්වවිද්‍යාලය, පවුලේ තොරතුරු දැනගැනීමටත්, හඬට සවන් දීමට හා වීඩියෝවක් නැරඹීමටත් හැකි විය. මෙම පටිපාටිය,
(1) අධිපාඨනීයත්වයයි. (2) ස්වයංකරණයයි. (3) අංකිතකරණයයි.
(4) ජාලගතකරණයයි. (5) අන්තර් ක්‍රියාකාරිත්වයයි.

28. අන්තර් පුද්ගල සන්නිවේදනයේදී ඝෝෂාවක් ලෙස සැලකීමට **අවම** ඉඩක් ඇත්තේ,
(1) හිසරදයයි. (2) සතුටයි. (3) දෝංකාරයයි. (4) පැහැදිලි බවයි. (5) බියජනක බවයි.

29. පහත ප්‍රකාශ සලකන්න.
*A* - එය පුද්ගල නිදහසේ දිගුවකි.
*B* - සිය අභිමතය පරිදි ඒක පාර්ශ්විකව මත දැක්වීම සිදු කළ හැකිය.
*C* - ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන්හි මාධ්‍ය මගින් ග්‍රාහකයා වෙත යොමු වන තොරතුරු පිළිබඳ එකඟවීම හෝ නොවීම කළ හැකිය.

ඉහත ප්‍රකාශ අතුරෙන් මාධ්‍ය නිදහසට අදාළව නිවැරදි වන්නේ,
(1) *A* පමණි. (2) *A* හා *B* පමණි.
(3) *A* හා *C* පමණි. (4) *B* හා *C* පමණි.
(5) *C* පමණි.


30. සමීක්ෂණ ක්‍රියාවලියේදී දත්ත රැස්කිරීමෙන් පසු අනුගමනය කළ යුතු ඊළඟ පියවර වන්නේ, පිළිවෙළින්
(1) ගැටලුව හඳුනාගැනීම, දත්ත විශ්ලේෂණය හා නිගමනවලට එළඹීමයි.
(2) දත්ත විශ්ලේෂණය, නිගමනවලට එළඹීම හා වාර්තාව ලිවීමයි.
(3) අරමුණු හඳුනාගැනීම, නිගමනවලට එළඹීම හා වාර්තාව ලිවීමයි.
(4) නිගමනවලට එළඹීම, දත්ත විශ්ලේෂණය හා වාර්තාව ලිවීමයි.
(5) මාතෘකාව තීරණය කිරීම, දත්ත විශ්ලේෂණය හා නිගමනවලට එළඹීමයි.

31. මහජන සම්බන්ධතාවේදී 'කිසිවක් සැඟවීම නොකළ යුතු ය' යන සංකල්පය මතුකර දක්වනුයේ,
(1) පුවත් නියෝජිත ආකෘතියෙනි.
(2) ප්‍රචාරණ ආකෘතියෙනි.
(3) මහජන තොරතුරු ආකෘතියෙනි.
(4) ද්වි-මාර්ගික අසමමිතික ආකෘතියෙනි.
(5) ද්වි-මාර්ගික සමමිතික ආකෘතියෙනි.

● අංක 32 සිට 34 තෙක් ප්‍රශ්න සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

ලබන මස පළමු ඉරිදා පවත්වන සිය උපන්දින සාදය සඳහා තම මිත්‍ර භානුට (B) ආරාධනා කිරීමට ආශා (A) තීරණය කළ අතර ඒ බව දැන්වීමට දුරකථන ඇමතුමක් (P) ලබා දුන්නා ය. එදින තම නිවසට ඥාති පිරිසක් පැමිණෙන බව සිහිපත් වූ භානු (B) මිතුරියගේ ආරාධනය දුරකතන ඇමතුමක් (Q) මගින් ම ස්තුතිපූර්වකව ප්‍රතික්ෂේප කළේ ය.

මෙම ක්‍රියාවලිය රූප සටහනක් මගින් මෙසේ පෙන්වා දිය හැකිය.




32. ඉහත තොරතුරු අනුව P හා Q මූලික වශයෙන් සමන්විත වන්නේ,
(1) ශබ්දවලිනි. (2) වචනවලිනි. (3) තොරතුරුවලිනි. (4) සංකේතවලිනි. (5) දත්තවලිනි.

33. මෙහිදී B ⟶ Q ⟶ A ක්‍රියාවලිය හැඳින්වීමට වඩාත් උචිත යෙදුම වන්නේ,
(1) ආකේතකරණය යි.
(2) විකේතකරණය යි.
(3) සම්ප්‍රේෂණය යි.
(4) ප්‍රතිපෝෂණය යි.
(5) ප්‍රතිග්‍රහණය යි.

34. ඔස්ගුඩ් සහ ශ්‍රාම් සන්නිවේදන ආකෘතියට අනුව පණිවිඩය ලබන (B) තුළ පිළිවෙළින් සිදුව ඇති ක්‍රියාවලිය කුමක් ද?
(1) විකේතකරණය, අර්ථකථනය හා ආකේතකරණය
(2) ආකේතකරණය, විකේතකරණය හා අර්ථකථනය
(3) අර්ථකථනය, ආකේතකරණය හා විකේතකරණය
(4) ආකේතකරණය, අර්ථකථනය හා විකේතකරණය
(5) විකේතකරණය, ආකේතකරණය හා අර්ථකථනය

35. මහජන සම්බන්ධතාව හා දැන්වීම්කරණය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දැන්වීම්කරණය කළමනාකරණ කාර්යයකි.
(2) පෙළඹවීම වැදගත් වන්නේ දැන්වීම්කරණයේදී පමණකි.
(3) මහජන සම්බන්ධතාව අලෙවිකරණ කාර්යයකි.
(4) හොඳහිත වර්ධනය මහජන සම්බන්ධතාවයේදී මෙන් ම දැන්වීම්කරණයේදී ද අපේක්ෂා කෙරේ.
(5) දැන්වීම්කරණය සහ මහජන සම්බන්ධතාව යන දෙකෙහිදීම ජනමාධ්‍ය භාවිත කෙරේ.

36. සමීක්ෂණ පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) සාපේක්ෂව කෙටි කාලයක් වැය වේ.
(2) විස්තරාත්මක, ගැඹුරු පිළිතුරු ලබා ගත හැකි වේ.
(3) සාපේක්ෂව අඩු වියදමකින් සිදු කළ හැකි වේ.
(4) විශාල දත්තදායකයන් පිරිසක් සහභාගි කර ගත හැකි වේ.
(5) මෘදුකාංග භාවිතයෙන් ක්ෂණිකව දත්ත විශ්ලේෂණය කළ හැකි වේ.

[ පස්වැනි පිටුව බලන්න

37. සන්නිවේදනය හා සම්බන්ධ වැදගත් දින කිහිපයක් A, B, C, D අක්ෂර මගින් දක්වා ඇති අතර එම දින නම්කර ඇති ආකාරය අංක 1, 2, 3, 4 යටතේ අපිළිවෙළින් දක්වා ඇත.

A . පෙබරවාරි 13 — 1. සාක්ෂරතා දිනය
B . මැයි 03 — 2. මානව හිමිකම් දිනය
C . සැප්තැම්බර් 08 — 3. ලෝක ගුවන්විදුලි දිනය
D . දෙසැම්බර් 10 — 4. නිදහස් මාධ්‍ය දිනය

ඉහත දින සහ නම් නිවැරදිව ගළපා ඇති වරණය තෝරන්න.
(1) A1 , B2 , C3 , D4
(2) A2 , B3 , C4 , D1
(3) A4 , B2 , C1 , D3
(4) A3 , B4 , C1 , D2
(5) A4 , B3 , C2 , D1

38. පාසල් ළමුන් ඉලක්ක කර ගනිමින් අධ්‍යාපනික වැඩසටහන් විකාශනය කිරීම සඳහා වෙබ් ගුවන්විදුලියක් ආරම්භ කිරීමේ අවශ්‍යතාව ගුරුතුමා ළමුන්ට අවධාරණය කළේ ය. මෙම යෝජනාවට වඩාත් අදාළ මාධ්‍ය ප්‍රවණතාව වන්නේ,
(1) මාධ්‍ය අභිසරණතාවයි.
(2) නිර්මහාපරිමාණකරණයයි.
(3) නිර්නියාමනයයි.
(4) නවෝත්පාදන විසරණයයි.
(5) ශිෂ්‍ය කේන්ද්‍රීයතාවයි.

39. කාර්මික විප්ලවයෙන් පසු යුරෝපයේ මහජන සම්බන්ධතා සංකල්පය ව්‍යාප්ත වූයේ,
(1) මහජනතාව හා කර්මාන්ත සම්බන්ධ කෙරෙන්නක් වශයෙනි.
(2) කර්මාන්ත හා රජය අතර සබඳතාව තහවුරු කිරීමක් වශයෙනි.
(3) අලෙවිය ඉහළ නංවාගත හැකි දැන්වීම්කරණ විධික්‍රමයක් වශයෙනි.
(4) ව්‍යාපාරික සබඳතා ශක්තිමත් කෙරෙන අලෙවිකරණ උපාය මාර්ගයක් වශයෙනි.
(5) පාලකයන් හා සේවකයන් අතර ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියක් වශයෙනි.

40. ශ්‍රී ලංකාවේ තොරතුරු අයිතිය පිළිබඳ නීතිය සම්බන්ධයෙන් වූ සංවාදයකදී පහත සඳහන් අදහස් ඉදිරිපත් විය.

සීතා - කිසිදු බාධාවකින් තොරව තොරතුරු ලබාගැනීමට ඇති හැකියාව තොරතුරු වෙත ප්‍රවේශ වීම මගින් තහවුරු කරයි.

රොෂාන් - තොරතුරු පනත මගින් ආණ්ඩුකරණයේදී මහජනයාට විවෘතභාවය හා විනිවිදභාවය පිළිබඳ මග පෙන්වයි.

රමේෂ් - අදාළ පුද්ගලයාගේ ලිඛිත කැමැත්තෙන් තොරව ඇයගේ/ඔහුගේ වෛද්‍ය වාර්තාවක් වෙනත් පාර්ශ්වයක් වෙත හෙළිදරව් කිරීම සිදු කළ නොහැක.

පුෂ්පිකා - අභියාචනා ක්‍රියාවලියේදී තොරතුරු අයිතිය පිළිබඳ කොමිසම වැදගත් භූමිකාවක් ඉටු කරයි.

මාවන් - අයදුම්කරු වෙත තොරතුරු ලබා දෙන්නේ එකී තැනැත්තාට ඇති අදාළත්වය මත පමණි.

ඉහත ප්‍රකාශ අතුරෙන් තොරතුරු අයිතිය පිළිබඳ **අදාළ නොවන** අදහස ඉදිරිපත් කරන්නේ,
(1) මාවන් ය. (2) සීතා ය. (3) රොෂාන් ය. (4) පුෂ්පිකා ය. (5) රමේෂ් ය.

41. පහත තේමා හා විස්තර පිළිබඳ අවධානය යොමුකරන්න.

| තේමා | | විස්තරය |
|---|---|---|
| 1. සාම්ප්‍රදායික සංස්කෘතිය | - | A. නොගැඹුරු සරල මහාපරිමාණ නිෂ්පාදන සහිතයි. |
| 2. ජන සංස්කෘතිය | - | B. වාර්ගික හා ජාතික සංස්කෘතීන් යටපත් කරයි. |
| 3. ජනප්‍රිය සංස්කෘතිය | - | C. තොරතුරු සංස්කෘතියේ විශේෂ ප්‍රභේදයකි. |
| 4. මාධ්‍ය සංස්කෘතිය | - | D. සම්භාව්‍ය සංස්කෘතීන් බිහිවීමට පාදක වෙයි. |
| 5. ගෝලීය සංස්කෘතිය | - | E. උත්තරීතර සංකේත පද්ධතියක් මත ගොඩනැගේ. |

ඉහත තේමා සහ විස්තර ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) 1C, 2D, 3B, 4E, 5A
(2) 1D, 2E, 3C, 4A, 5B
(3) 1D, 2E, 3A, 4B, 5C
(4) 1E, 2D, 3A, 4C, 5B
(5) 1E, 2D, 3C, 4A, 5B

[ පෙරළා බලන්න

42. කිසියම් රටක සංවර්ධනය එම රටෙහි සමාජ, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික ලක්ෂණ මත පදනම්ව එහි රටවැසියන් විසින්ම සිදුකරනු ලබන ක්‍රියාවලියක් බවට පත් වේ නම් එය,
(1) ප්‍රාදේශීයකරණයයි.
(2) ජනතා සක්‍රීයතාවයි.
(3) දරිද්‍රතාව අවම කිරීමයි.
(4) සමාජානුයෝජනයයි.
(5) සමාජීය සම්බන්ධතා හා සමානාත්මතාව ගොඩනැගීමයි.

43. ජනප්‍රිය සංස්කෘතිය තුළ ජනමාධ්‍ය වඩාත් මතුකර දක්වන්නේ කුමක් ද?
(1) සෞන්දර්යාත්මක සංදේශ
(2) අධ්‍යාපන වටිනාකම්වලින් යුක්ත සංදේශ
(3) මානවවාදය මතුකර දක්වන සංදේශ
(4) ග්‍රාහක සදාචාරය වර්ධනය කරන සංදේශ
(5) වාණිජ ප්‍රතිලාභ ඇතුළත් සංදේශ

44. ග්‍රාහක භූමිකාව පිළිබඳ නිදොස් ප්‍රකාශය කුමක් ද?
(1) ග්‍රාහක භූමිකාව ස්ථිතික වූවකි.
(2) ග්‍රාහකයා සැමවිටම සවිඥානික ය.
(3) ග්‍රාහකයාට සන්නිවේදකයෙක් විය නොහැකිය.
(4) ග්‍රාහක සාක්ෂරතාව විසම වේ.
(5) ග්‍රාහක අත්දැකීම් පසුතලය පුළුල් වූවකි.

45. පහත ප්‍රකාශ සලකන්න.
*A* - පුද්ගල හා සමාජ හැසිරීම් වෙනස් කිරීමේ වැඩසටහන්වලට ප්‍රමුඛතාව දීම
*B* - සන්නිවේදනය හා සමාජ ව්‍යූහය පිළිබඳ සම්බන්ධතා වැඩි දියුණු කිරීම
*C* - විචාරාත්මක සිද්ධාන්ත මගින් මානව සමාජ ගැටලුවලට විසඳුම් සැපයීම
*D* - කේන්ද්‍රගත බලය ශක්තිමත් කිරීම.

ඉහත ප්‍රකාශ ඇසුරින් ශ්‍රීනිවාස් මෙල්කොට් විසින් සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ දැක් වූ අදහසට සෘජුව අදාළ වන්නේ,
(1) *A* හා *B* පමණි.
(2) *A*, *B* හා *C* පමණි.
(3) *B* හා *C* පමණි.
(4) *B*, *C* හා *D* පමණි.
(5) *C* හා *D* පමණි.

46. රමණි පංති කාමරයේදී නිර්මාණාත්මක චින්තනය පිළිබඳ අදහස් කිහිපයක් ප්‍රකාශ කළා ය.
*A* - නිර්මාණයක් ස්ව අත්දැකීම් මත පමණක් පදනම් වේ.
*B* - නිර්මාණ කාර්ය සඳහා පරිකල්පනය උපයෝගී වේ.
*C* - ප්‍රතිභාව, සතතාභ්‍යාසය සහ ව්‍යුත්පත්තිය වැදගත් වේ.
*D* - නව අදහස් කෙරෙහි නම්‍යශීලීවීම ප්‍රයෝජනවත් වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
(1) *A*, *B* හා *C* පමණි.
(2) *A*, *B* හා *D* පමණි.
(3) *A* හා *C* පමණි.
(4) *B* හා *C* පමණි.
(5) *B*, *C* හා *D* පමණි.

47. යුනෙස්කෝ සංවිධානය විසින් දක්වා ඇති පරිදි රටක සමාජ දුරස්ථභාවය අවම කර, සාමය සහ සමානාත්මතාව ඇති කිරීම සඳහා කළ යුත්තේ,
(1) මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය රජය සතු කිරීමයි.
(2) මාධ්‍ය තාක්ෂණය වර්ධනය කිරීමයි.
(3) සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කිරීමයි.
(4) මානව හිමිකම් පිළිබඳ දැනුම වර්ධනය කිරීමයි.
(5) මාධ්‍ය ආචාරධර්ම සකස් කිරීමයි.

**48.** පහත ප්‍රකාශ අතුරෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස පිළිබඳ **වැරදි** ප්‍රකාශය වන්නේ, එය

(1) පුරවැසියන්ට පමණක් සීමා වූවකි.
(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන තිබේ.
(3) හදිසි නීතියට යටත් වේ.
(4) ඇතැම් විට මූලික අයිතිවාසිකමකි.
(5) අන් අයගේ අයිතිවාසිකම් මත සීමා වේ.

**49.** පහත අවස්ථා සලකන්න.

X – ජාතික චිත්‍රපට සංස්ථාවෙන් A නමැති චිත්‍රපටය නිෂ්පාදනය සඳහා ලබා දී ඇති ණය ආධාර මුදල පිළිබඳ විස්තරයක් ඉල්ලා සිටීම

Y – රජයේ චිත්‍රපට අංශයෙන් ලබාගත් චිත්‍රපටයක කොටසක් ප්‍රවෘත්ති වාර්තාවකට ඇතුළත් කිරීම

ඉහත අවස්ථාවන්ට අදාළ වන පනත් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) X – බුද්ධිමය දේපළ පනත හා Y – තොරතුරු දැනගැනීමේ පනත
(2) X – තොරතුරු දැනගැනීමේ පනත හා Y – බුද්ධිමය දේපළ පනත
(3) X – ප්‍රසිද්ධ රැඟුම්පාලක පනත හා Y – ජාතික චිත්‍රපට සංස්ථා පනත
(4) X – ජාතික චිත්‍රපට සංස්ථා පනත හා Y – ප්‍රසිද්ධ රැඟුම්පාලක පනත
(5) X – ජාතික චිත්‍රපට සංස්ථා පනත හා Y – බුද්ධිමය දේපළ පනත

**50.** මහජන සම්බන්ධතා පිළිබඳ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

*A* - අභ්‍යන්තර-බාහිර පාර්ශව සමග සබඳතා පැවැත්වීම
*B* - දේශපාලනික-ප්‍රභූ සම්බන්ධතා කළමනාකරණය කිරීම
*C* - ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
*D* - මාධ්‍ය ආයතන ප්‍රධානීන් සමග සබඳතා පැවැත්වීම

ඉහත ක්‍රියාකාරකම්වලට අදාළ වන මහජන සම්බන්ධතා අවස්ථා පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ව්‍යාපාර, මාධ්‍ය, ආයතනික හා රාජ්‍ය මහජන සම්බන්ධතා
(2) ආයතනික, රාජ්‍ය, ව්‍යාපාර හා මාධ්‍ය මහජන සම්බන්ධතා
(3) මාධ්‍ය, ආයතනික, රාජ්‍ය හා ව්‍යාපාර මහජන සම්බන්ධතා
(4) රාජ්‍ය, ව්‍යාපාර, මාධ්‍ය හා ආයතනික මහජන සම්බන්ධතා
(5) ආයතනික, රාජ්‍ය, මාධ්‍ය හා ව්‍යාපාර මහජන සම්බන්ධතා

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

29 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**
* ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **40**කි.

1. පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවය සාර්ථක කරගැනීම සඳහා මාධ්‍ය ඒකකයේ දායකත්වය ඉතා වැදගත් බව ගුරුවරයා විසින් අවධාරණය කරන ලදී.
   (i) උත්සවය හා සම්බන්ධ කටයුතුවලදී ගුරුවරයා හා ශිෂ්‍යයින් අතර ඇතිවිය හැකි අවිධිමත් සන්නිවේදන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)
   (ii) උත්සව සංවිධානයේදී අන්තර්-පුද්ගල සන්නිවේදනය යොදාගැනීමේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) මෙම උත්සවය සමූහ සන්නිවේදන අවස්ථාවකි. උත්සවය මෙහෙයවන නිවේදකයින්ට එම කාර්යය වඩාත් සාර්ථක කරගැනීමේදී යොදාගත හැකි සමූහ සන්නිවේදන විධික්‍රම **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
   (iv) උත්සවයේ විවිධ අංග සඳහා ජනකලා තේමා භාවිත කිරීමට තීරණය විය. මේ සඳහා ජනකලා යොදාගත හැකි අවස්ථා **හතරක්** නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 16)

2. (i) අනර්ථ සන්නිවේදනයේ විශේෂතා **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
   (ii) ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට හේතුවන කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) "රූපවාහිනිය ආකර්ෂණීය මාධ්‍යයකි." මෙම ප්‍රකාශය රූපවාහිනී මාධ්‍යයේ මූලික ලක්ෂණ **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 12)
   (iv) පහත කරුණු හතර පිළිබඳ අවධානය යොමු කරමින් 'ජනප්‍රිය සංස්කෘතිය' මැයෙන් පුවත්පතක් සඳහා වචන 250කට නොඅඩු ලිපියක් සකස් කරන්න.
      (අ) නොගැඹුරු අන්තර්ගතයක් සහිත වීම
      (ආ) පොදුවේ රසවිඳිය හැකි වීම
      (ඇ) මහා පරිමාණ නිෂ්පාදන සහිත වීම
      (ඈ) වාණිජ පරමාර්ථවලින් යුක්ත වීම
   (ලකුණු 16)

3. විවිධ සන්නිවේදන ස්තරයන්හි ඔපාදූප ක්‍රියාත්මක වන බව පෙනේ.
   (i) සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග අතුරෙන් ඔපාදූප නියෝජනය කරනුයේ කවර මූලිකාංගය ද? (ලකුණු 04)
   (ii) ඔපාදූප විධිමත් සන්නිවේදන ස්වරූපයක් ලෙස නොසැලකෙන්නේ ඇයි දැයි යන්නට හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   (iii) "ඇතැම් සමාජ මාධ්‍ය ඔපාදූප පාදක කරගෙන ක්‍රියාත්මක වේ." සමාජ මාධ්‍යයන්හි පහත ලක්ෂණ නිදසුන් කොට ගනිමින් මෙය පැහැදිලි කරන්න.
      (අ) අන්තර්ගතය නිර්මාණය කිරීම
      (ආ) සහභාගීත්වය
      (ඇ) අන්තර්ගතය හුවමාරු කර ගැනීම
   (ලකුණු 12)
   (iv) ඔපාදූප වෙබ් අඩවි මගින් ඇති කරන සමාජ බලපෑම පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට අදහස් කරන ඔබ දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිත කිරීමට අපේක්ෂා කරයි. එම ප්‍රශ්නාවලිය සැකසීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

[දෙවැනි පිටුව බලන්න

Past Papers WiKi - Most Extensive Wikipedia of Past Papers

**4.** (i) මාධ්‍ය සාක්ෂරතාව හා සබැඳි ලක්ෂණ රාශියකි. යුරෝපා කොමිසමේ නිර්වචනයට අනුව මාධ්‍ය සාක්ෂරතාවෙහි මූලික ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ජනමාධ්‍ය සතු කාර්යභාරය විවිධාකාර වේ. එක් නිදසුනක් බැගින් භාවිත කරමින් පහත කාර්යයන් ඉටු කරන අයුරු කෙටියෙන් විස්තර කරන්න.

(අ) අර්ථකථනය

(ආ) සහසම්බන්ධය (ලකුණු 08)

(iii) මාධ්‍ය සාක්ෂරතාව බහුවිධ මාන සහිත (Multi-dimentional) සංකල්පයකි. මාධ්‍ය භාවිතයේදී පහත සඳහන් මානවල වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) චිත්තවේගී මානය

(ආ) සෞන්දර්ය මානය (ලකුණු 12)

(ඉ) සදාචාරාත්මක මානය

(iv) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවල නව ප්‍රවණතා දෙකක් පහත දැක්වේ. ඒවා ක්‍රියාත්මක වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(අ) ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදාගැනීම

(ආ) විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම (ලකුණු 16)

**5.** පාසලේ සාංවත්සරික සැමරුම් උත්සවයෙහි සංවිධායක කමිටු සාමාජිකයෙකු ලෙස ඔබ පත්කර ඇතැයි සිතන්න.

(i) ඉහත අවස්ථාව සඳහා සිද්ධි කළමනාකරණය අවශ්‍ය වන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ එහි මාධ්‍ය නිලධාරියා ලෙස ක්‍රියාකරන්නේ නම් උත්සවයට පූර්ව වශයෙන් ඔබ විසින් ඉටුකළ යුතු කාර්ය **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) උසස් මාධ්‍ය සාක්ෂරතාවක් සහිත ශිෂ්‍යයෙක් බිහිකිරීම සැමරුමේ එක් තේමාවකි. ජේම්ස් පොටර්ට අනුව මාධ්‍ය සාක්ෂරතාව දියුණු කර ගැනීමෙන් ලැබෙන වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) පාසල පිළිබඳ බාහිර සමාජය තුළ යහපත් ප්‍රතිරූපයක් ඇතිකිරීමේදී සමාජ මාධ්‍ය මගින් ඇති කළ හැකි බලපෑම් **හතරක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

**6.** ජනමාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පිළිබඳ මහජන මත විමසා බැලෙන සමීක්ෂණයක දත්ත රැස් කරන්නෙක් ලෙස කටයුතු කිරීමට ඔබට අවස්ථාව ලැබී ඇත.

(i) සමීක්ෂණ භාවිතයේ වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිත ප්‍රවේශ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) "සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් නියාමනය කළ යුතු ය." මෙම ප්‍රකාශයට පක්ෂව හා විපක්ෂව කරුණු **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 16)

**7.** ඔබ ජාතික ප්‍රජා සංවර්ධන ආයතනයේ මහජන සම්බන්ධතා නිලධාරියා යැයි සිතන්න.

(i) මහජන සම්බන්ධතා නිලධාරී වෘත්තිය අතීතයේ හැඳින් වූ තනතුරු නාම **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) ආයතනයේ මාධ්‍ය නිලධාරියාගේ හා මහජන සම්බන්ධතා නිලධාරියාගේ කාර්යභාරය සමාන වන අවස්ථා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ප්‍රජාව තුළ දරිද්‍රතාව අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි පියවර **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදාගත හැකි ආකාරය පහත කරුණු ඔස්සේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(අ) අවශ්‍යතා කේන්ද්‍රීයතාව

(ආ) යහපත් පරිසරයක් ගොඩනැගීම (ලකුණු 16)

* * *

WWW.PastPapers.WIKI

Sri Lanka Biggest past papers Bank

AI CAMERA
Shot on realme C11 2021

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2022 (2023)

**විෂය අංකය** பாட இலக்கம் **29**

**විෂයය** பாடம் **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 1 | 31. | 3 | 41. | 4 |
| 02. | 2 | 12. | 2 | 22. | 4 | 32. | 4 | 42. | 1 |
| 03. | 1 | 13. | 2 | 23. | 5 | 33. | 4 | 43. | 5 |
| 04. | 3 | 14. | 3 | 24. | 3 | 34. | 1 | 44. | 4 |
| 05. | 3 | 15. | 2 | 25. | 5 | 35. | 5 | 45. | 3 |
| 06. | 1 | 16. | 1 | 26. | 3 | 36. | 2 | 46. | 5 |
| 07. | 3 | 17. | 5 | 27. | 1 | 37. | 4 | 47. | 3 |
| 08. | 1 | 18. | 4 | 28. | 4 | 38. | 2 | 48. | 4 |
| 09. | 2 | 19. | 5 | 29. | 3 | 39. | 5 | 49. | 2 |
| 10. | 3 | 20. | 1 | 30. | 2 | 40. | 1 | 50. | 2 |

○ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 50 = 50

**1. පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවය සාර්ථක කරගැනීම සඳහා මාධ්‍ය ජීවිතයේ දායකත්වය ඉතා වැදගත් බව ගුරුවරයා විසින් අවධාරණය කරන ලදී.**

**(i) උත්සවය හා සම්බන්ධ කටයුතුවලදී ගුරුවරයා හා ශිෂ්‍යයින් අතර ඇතිවිය හැකි අවිධිමත් සන්නිවේදන අවස්ථා දෙකක් සඳහන් කරන්න.** **(ලකුණු 04)**

ගුරුවරයා හා ළමයා අතර නිලනොවන ලෙස සිදුවන උත්සවයට අදාළ ඕනෑම සන්නිවේදන අවස්ථාවක් මීට අදාළ කරගත හැකිය.

- සිසුන් විසින් හදිසියේ ඇතිවෙන වෙනස්කම් පිළිබඳ ගුරුවරයා දැනුවත් කිරීම.
- උත්සවයේ සංවිධාන කටයුතු වලදී ගුරු සිසු දෙපාර්ශ්වය අගය කිරීම, මග පෙන්වීම, ප්‍රතික්ෂේප කිරීම.
- වෙනත් පාසලක පැවැත්වූ උත්සව පිළිබඳව තොරතුරු ප්‍රකාශ කිරීම.
- උත්සවය පිළිබඳ දෙමාපියන් දරන අදහස් ප්‍රකාශ කිරීම.
- උත්සවය පිළිබඳ සමාජය තුළ පවතින ආරංචි ප්‍රකාශ කිරීම.
- උත්සව කටයුතු අවස්ථාවේ සිදු කරන ක්ෂණික වෙනස්කම් පිළිබඳ ගුරුවරයා විසින් කරනු ලබන හදිසි දැනුම් දීම.
- උත්සවය හා සම්බන්ධ ඕපදූප, කටකතා යනාදිය ගුරුවරයාට ප්‍රකාශ කිරීම.
- නව මාධ්‍ය හරහා උත්සවය පිළිබඳ අවිධිමත් තොරතුරු ගුරු සිසු දෙපාර්ශවය අතර හුවමාරු කර ගැනීම.

ලකුණු $2 \times 2 = 4$

**(ii) උත්සව සංවිධානයේදී අන්තර්-පුද්ගල සන්නිවේදනය යොදාගැනීමේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.** **(ලකුණු 08)**

- සංවිධායකයින් අතර මෙන්ම සංවිධායකයින් හා සෙසු පාර්ශව අතර ද වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදිය හැකිවීම.
- සංවිධායකයින් අතර අන්තර් සබඳතා වර්ධනය කර ගැනීම.
- උත්සව කටයුතු සඳහා පෙළඹවීමේ හැකියාව වැඩිවීම.
- සංවිධායකයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ගොඩනගා ගැනීම.
- එකිනෙකා අතර වඩා තීව්‍ර සහවේදනයකට අවකාශ සැලසීම.
- උත්සවය සංවිධානය කිරීමේ දී ඇතිවන සැක සංකා දුරුකර ගත හැකිවීම.

ලකුණු $4 \times 2 = 8$

(iii) මෙම උත්සවය සමූහ සන්නිවේදන අවස්ථාවකි. උත්සවය මෙහෙයවන නිවේදකයින්ට එම කාර්යය වඩාත් සාර්ථක කරගැනීමේදී යොදාගත හැකි සමූහ සන්නිවේදන විධික්‍රම තුනක් විස්තර කරන්න. (ලකුණු 12)

- අරමුණු සහගත බව.
- පෙර සූදානම.
- වාචික මෙන්ම නිර්වාචික සන්නිවේදන ක්‍රම භාවිතය.
- විවිධ තාක්ෂණික උපකරණ, මෙවලම් භාවිතය.
- ආකර්ෂණීය කථන විලාසය.
- ප්‍රදීපාගාර උපක්‍රමය.
- ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය.
- ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳ සැලකිලිමත් වීම.
- කාල කළමනාකරණය.
- ආචාරශීලීත්වය.
- වගකීම හා වගවීම.

ඉහත විධික්‍රම උත්සවය මෙහෙයවන නිවේදකයාගේ භූමිකාවට අදාළව විස්තර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

ලකුණු $4 \times 3 = 12$

(iv) උත්සවයේ විවිධ අංග සඳහා ජනකලා තේමා භාවිත කිරීමට තීරණය විය. මේ සඳහා ජනකලා යොදාගත හැකි අවස්ථා හතරක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 16)

- ආරාධනා පත්‍රය - සන්නසක ස්වරූපය , තල්පත, ගොක්කොළ
- සමාරම්භක කටයුතු - බුලත් දීම, බෙරගැසීම
- සියලු සැරසිලි - ගොක්කොළ, කැටයම්, බීරලු, සේසත් ආදී....
- ප්‍රචාරණ කටයුතු - අණබෙරකරුවෙක් මගින් ප්‍රචාරණය
- ප්‍රාසාංගික අංග - රූකඩ, සාම්ප්‍රදායික තාල භාණ්ඩ, ඇඳුම් පැළඳුම්, වෙස්මුහුණු
- ත්‍යාග ප්‍රදානය - මූර්ති, කැටයම්, අත්කම්, චිත්‍ර

අදාළ අවස්ථාව නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

ලකුණු $4 \times 4 = 16$



CamScanner

2. (i) අනම්‍ය සන්නිවේදනයේ විශේෂතා දෙකක් නම් කරන්න. (ලකුණු 04)

- කාර්යක්ෂමව සන්නිවේදනයේ යෙදීමට ඇති හැකියාව
- අඩු පිරිවැය.
- ආරක්ෂිතබව.
- ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදිය හැකිවීම.
- එකවර පුද්ගලයින් රැසක් සමග සන්නිවේදනයේ යෙදිය හැකි වීම.
- භෞතික වශයෙන් ඉඩකඩ අවශ්‍ය නොවීම.
- වේලාව, දුර, කාලය, ස්ථානය ආදිය පාදක නොවීම.
- අන්තර්ජාලය හා පරිගණකය/සුහුරු ජංගම දුරකථනය මූලික කර ගනිමින් ක්‍රියාත්මක වීම.

ලකුණු 2 x 2 = 4

(ii) ශ්‍රව්‍ය සන්නිවේදන කුසලතා වර්ධනයට හේතුවන කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

- මැනවින් සවන්දීම.
- විවිධ හඬ වෙන්කර හදුනාගැනීම.
- ශ්‍රව්‍ය සන්නිවේදන අවස්ථා අධ්‍යයනය කිරීම.
- විවිධ ශබ්ද භාවිත කරමින් නිර්මාණ බිහි කිරීම.
- අවධානය බිඳෙන අවස්ථා පිළිබඳ ව (distractors) සිත යොමු නොකිරීම.
- යටි පෙළ පිළිබඳ අවධානය යොමු කිරීම.

ලකුණු 4 x 2 = 8

(iii) "රූපවාහිනිය ආකර්ෂණීය මාධ්‍යයකි." මෙම ප්‍රකාශය රූපවාහිනී මාධ්‍යයේ මූලික ලක්ෂණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 12)

- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වීම.
- විවිධාකාර අන්තර්ගතයන්ගෙන් සමන්විත වීම.
- විචිත්‍රවත් ආකෘති වලින් සමන්විත වීම.
- සැලසුම් සහගත ක්‍රියාදාමයක් හරහා ඉදිරිපත් වීම.
- ජාත්‍යන්තර මාධ්‍ය වැඩසටහන් ආකෘති අනුගමනය කිරීම.
- සංස්කරණ, සජීවිකරණ ප්‍රයෝග ආදී තාක්ෂණික උපක්‍රම භාවිතය.
- ගෘහස්ථව නරඹන මාධ්‍යයක් වීම.
- ක්ෂණික තොරතුරු වාර්තා කිරීම.

ලකුණු 6 x 2 = 12

(iv) පහත කරුණු හතර පිළිබඳ අවධානය යොමු කරමින් 'ජනප්‍රිය සංස්කෘතිය' මැයෙන් පුවත්පතක් සඳහා වචන 250කට නොඅඩු ලිපියක් සකස් කරන්න.
(අ) නොගැඹුරු අන්තර්ගතයක් සහිත වීම
(ආ) පොදුවේ රසවිඳිය හැකි වීම
(ඉ) මහා පරිමාණ නිෂ්පාදන සහිත වීම
(ඊ) වාණිජ පරමාර්ථවලින් යුක්ත වීම

(ලකුණු 16)

(අ) නොගැඹුරු අන්තර්ගතයක් සහිත වීම

ජනප්‍රිය සංස්කෘතිය ඇසුරු කිරීමට දැනුමක් හෝ බුද්ධියක් සුවිශේෂීව අවශ්‍ය නොවීම.

(ආ) පොදුවේ රස විඳිය හැකි වීම

සියලුම ග්‍රාහකයින්ට ( ළමා, තරුණ, වැඩිහිටි) එකසේ රස විඳීමේ හැකියාව.

(ඉ) මහා පරිමාණ නිෂ්පාදන සහිත වීම

වෙළඳපොළ සඳහා බහුල වශයෙන් භාණ්ඩ හා සේවා හඳුන්වා දීම.

(ඊ) වාණිජ පරමාර්ථ වලින් යුක්ත වීම

ව්‍යාපාරික ලාභය මූලික පරමාර්ථය කර ගැනීම.

ඉහත කරුණු ප්‍රමාණවත් ලෙස විස්තර කර පුවත්පත සඳහා ලිපිය සකස්කර තිබිය යුතුය.

ලකුණු 4 x 4 = 16

| |
|---|
| 3. විවිධ සන්නිවේදන ස්තරයන්හි ඕපාදූප ක්‍රියාත්මක වන බව පෙනේ.<br>(i) සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග අතුරෙන් ඕපාදූප නියෝජනය කරනුයේ කවර මූලිකාංගය ද? (ලකුණු 04) |

සන්දේශය / පණිවිඩය Message

ලකුණු $4 \times 1 = 4$

| |
|---|
| (ii) ඕපාදූප විධිමත් සන්නිවේදන ස්වරූපයක් ලෙස නොසැලකෙන්නේ ඇයි දැයි යන්නට හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08) |

- නිල ස්වභාවයක් නොමැති වීම.
- නිශ්චිත ස්ථානයක්, කාලයක් නොපැවතීම.
- මූලාශ්‍රය පැහැදිලි නොවීම.
- නිශ්චිත ධූරාවලියක් නොමැති වීම.
- සැකය, කුතුහලය මත ක්‍රියාත්මක වීම.
- වගකිවයුත්තෙක් නොසිටීම.
- නිශ්චිත න්‍යාය පත්‍රයක් නොමැති වීම.
- ඕපදූප නිර්මාණය කරන්නාගේ අභිමතය ප්‍රකාශයට පත්වීම.

ලකුණු $4 \times 2 = 8$

| |
|---|
| (iii) "ඇතැම් සමාජ මාධ්‍ය ඕපාදූප පාදක කරගෙන ක්‍රියාත්මක වේ." සමාජ මාධ්‍යයන්හි පහත ලක්ෂණ නිදසුන් කොට ගනිමින් මේය පැහැදිලි කරන්න.<br>(අ) අන්තර්ගතය නිර්මාණය කිරීම<br>(ආ) සහභාගීත්වය<br>(ඉ) අන්තර්ගතය හුවමාරු කර ගැනීම (ලකුණු 12) |

(අ) අන්තර්ගතය නිර්මාණය කිරීම

- අසත්‍ය ලෙස සිරස්තල යෙදීම.
- අසත්‍ය අන්තර්ගත ගොඩනැගීම. (දුස්තොරතුරු)
- විකෘති කිරීම් භාවිත කිරීම.
- අසත්‍ය ඡායාරූප යෙදීම.
- යටි අරමුණු සහිතව සන්දේශ හැසිරවීම.
- අශ්ලීල ලෙස අන්තර්ගතය ගොඩනැගීම.

(ආ) සහභාගීත්වය

- සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.
- දුරකථන ඇමතුම්, හඬපට (voice cut) භාවිතය.
- නැරඹුම් වාර (views)
- කැමැත්ත ප්‍රකාශ කිරීම (like)
- අදහස් ප්‍රකාශ කිරීම (comments)
- emoji භාවිතය
- Tag කිරීම.
    - සජීවී විකාශ ( Live streams)
    - හුවමාරුකරු කර ගැනීම ( Sharing)

(ඉ) අන්තර්ගතය හුවමාරු කර ගැනීම

- සත්‍ය නොවන ජනප්‍රියත්වය, කුතුහලය, ආකර්ෂණය, භාවාත්මක ආදී කරුණු මත අන්තර්ගතය හුවමාරු වීම සිදු වේ.

සමාජ මාධ්‍ය පදනම් කරගෙන ඔපදූප ක්‍රියාත්මක වන ආකාරය ඉහත කරුණු ඇසුරෙන් නිදසුන් සහිතව විස්තර කළ යුතුය.

ලකුණු $4 \times 3 = 12$

(iv) ඔපාදූප වෙබ් අඩවි මගින් ඇති කරන සමාජ බලපෑම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට අදහස් කරන ඔබ දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිත කිරීමට අපේක්ෂා කරයි. එම ප්‍රශ්නාවලිය සැකසීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු හතරක් විස්තර කරන්න. (ලකුණු 16)

- මූලික අරමුණට ගැළපෙන ආකාරයට ප්‍රශ්නාවලිය සැකසීම.
- ප්‍රශ්නාවලිය තුළ බොහෝ කල්ගත වී ගිය කරුණු සම්බන්ධ ප්‍රශ්න ඇතුළත් නොකිරීම.
- නිශ්චිත පිළිතුරු ලබාදීමට දත්ත දායකයාට පහසු වන ආකාරයෙන් ප්‍රශ්නාවලිය සකස් කළ යුතුය.
- ඍජු පිළිතුරු නොලැබෙන ආකාරයේ ප්‍රශ්න වක්‍රව විමසිය යුතුය.
- ප්‍රමුඛතාව අනුව ප්‍රශ්න පෙළගැස්විය යුතුය.
- දත්ත දායකයා අපහසුතාවයට පත්වන ප්‍රශ්න නොඇසීම.
- විවෘත හා සංවෘත ප්‍රශ්න අරමුණට ගැළපෙන පරිදි යොදා ගත යුතුය.
- සීමාසහිත ප්‍රශ්න සංඛ්‍යාවක් ඇතුළත් කළ යුතුය.
- දීර්ඝ ප්‍රශ්න නොඇසීම.
- ව්‍යාකූල ප්‍රශ්න නොඇසීම.
- දත්ත දායකයාගේ පෞද්ගලිකත්වයට හානි නොවන ආකාරයේ ප්‍රශ්න සකස් කළ යුතුය.
- දත්ත දායකයාගේ ස්වභාවය අනුව ප්‍රශ්න සැකසිය යුතුය.
- පක්ෂපාතී පිළිතුරු අපේක්ෂාවෙන් තොරව ප්‍රශ්න සැකසිය යුතුය.

ඉහත කරුණු ඔපදූප වෙබ් අඩවි මගින් ඇති කරන සමාජ බලපෑමට විශේෂිතව පැහැදිලි කර ඇත්නම් පමණක් ලකුණු ලබා දෙන්න.

ලකුණු $4 \times 4 = 16$

CamScanner

4. (i) මාධ්‍ය සාක්ෂරතාව හා සබැඳි ලක්ෂණ රාශියකි. යුරෝපා කොමිසමේ නිර්වචනයට අනුව මාධ්‍ය සාක්ෂරතාවෙහි මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

- මාධ්‍ය සන්දේශ පරිහරණය කිරීම.
- මාධ්‍ය සන්දේශ විශ්ලේෂණය කිරීම.
- මාධ්‍ය සන්දේශ ඇගයුම.
- මාධ්‍ය සන්දේශ නිර්මාණය කිරීම.

fix answers

ලකුණු 2 x 2 = 04

(ii) ජනමාධ්‍ය සතු කාර්යභාරය විවිධාකාර වේ. එක් නිදසුනක් බැගින් භාවිත කරමින් පහත කාර්යයන් ඉටු කරන අයුරු කෙටියෙන් විස්තර කරන්න.
(අ) අර්ථකථනය
(ආ) සහසම්බන්ධය (ලකුණු 08)

(අ) අර්ථකථනය

- යම් සංසිද්ධියක් පිළිබඳ ග්‍රාහකයාට විවරණාත්මකව පැහැදිලි කර දීම.
- සමාජීය ප්‍රතිචාර ලබා ගනිමින් තොරතුරු විශ්ලේෂණය හා සංස්ලේෂණය කිරීම.
- සිදුවීමට අදාළ පසුබිම, බලපෑම, ආදී කරුණු ඉදිරිපත් කිරීම.

උදා- කොරෝනා රෝගය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විශේෂඥ වෛද්‍යවරු සහභාගී කරගෙන සිදු කරන මාධ්‍ය සාකච්ඡා.

(ආ) සහසම්බන්ධය

- පුද්ගලයාගේ පැවැත්මට අත්‍යවශ්‍ය රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලු ආයතන හා සංවිධාන සමඟ අන්‍යෝන්‍ය බැඳීම ඇති කිරීම.
- ජනමාධ්‍ය එකිනෙක පාර්ශව මුණගස්වන වේදිකාවක් වීම.

උදා - වන අලි ගැටලුව පිළිබඳව ජනතා අදහස්/ විවිධ ආයතන හා සංවිධාන වලින් ඉදිරිපත් වන අදහස්/ රජයේ අවධානයට ලක්කිරීම සඳහා මාධ්‍ය මැදිහත් වීම.

**උදාහරණය සහිතව ලියා ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදිය යුතුය.**

උදාහරණ දැක්වීම ලකුණු 2 x 2 = 4

විස්තර කිරීම ලකුණු 2 x 2 = 4

8

CS CamScanner

(iii) මාධ්‍ය සාක්ෂරතාව බහුවිධ මාන සහිත (Multi-dimentional) සංකල්පයකි. මාධ්‍ය භාවිතයේදී පහත සඳහන් මානවල වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.
(අ) චිත්තවේගී මානය
(ආ) සෞන්දර්ය මානය
(ඉ) සදාචාරාත්මක මානය

(ලකුණු 12)

(අ) චිත්තවේගී මානය

පුද්ගලයා තුළ සංවේදී හැඟීම් ඉස්මතු වන ආකාරයට මාධ්‍ය සන්දේශයන්හි තොරතුරු අන්තර්ගත වීම මෙම ගණයට අයත් වේ.

- හැඟීම් පිළිබඳ තොරතුරු අයත් වේ.
- විවිධ ශිල්ප ක්‍රම ඇසුරෙන් භාවමය හැඟීම් ඇති කරවයි.
- මාධ්‍ය සන්දේශවල චිත්තවේගී තොරතුරු සංකේත මගින් නිරූපණය කරයි.
- ආදරය, වෛරය, ශෝකය, බිය ආදී හැඟීම් විවිධ සන්දේශ ඔස්සේ වටහාගෙන රස විඳියි.
- නිර්මාණකරුවන්ගේ ඉඟි, සංඥා යනාදිය හඳුනා ගනී.
- සන්දේශවලින් කුතුහලය, සැකය, ප්‍රතිවිරුද්ධ අදහස් ආදී හැඟීම් ඇති කරවයි.

(ආ) සෞන්දර්ය මානය

නිර්මාණකරුවා තමාගේ නිර්මාණය තුළ කෙතරම් ප්‍රමාණයකට අපූර්වත්වය මතු කර ඇත්දැයි විමසීම මීට අයත් වේ.

- නිර්මාණය හඳුනාගනී.
- අපගේ දැස් හා දෙසවන් පිනවන තොරතුරු අයත් වේ.
- මිනුම් දඬු භාවිතයෙන් උසස් නිර්මාණකරුවන් හඳුනාගනී.
- නිර්මාණකරුගේ නිර්මාණ කුසලතා හඳුනාගනී.
- නිර්මාණයට අදාළ පරිදි ශිල්පීය ක්‍රම භාවිතා කිරීම පිළිබඳ අවබෝධ කර ගනී.
- නිර්මාණයක යෝග්‍ය බව සන්දර්භයට අනුව සිදුවන අයුරු විමසයි.

(ඇ) සදාචාරාත්මක මානය

නොයෙකුත් වටිනාකම් පිළිබඳ තොරතුරු ලබා දීම සිදුවේ. (හෘද සාක්ෂියේ ඇති මිනුම් දඬු ආශ්‍රිතව ගොඩනැගෙන තොරතුරු මෙම ගණයට අයත් වේ.)

- මාධ්‍ය නිර්මාණයක් තුළ සදාචාරාත්මක දේ කොතරම් දුරට අන්තර්ගතව ඇත්දැයි විමසයි.
- යම් ක්‍රියාවක හොඳ හෝ නරක පිළිබඳ නිගමනයකට එළඹෙයි.
- මාධ්‍යයේ විකාශනය වන චරිත පිළිබඳ විනිශ්වයකට එළඹෙයි.
- හොඳ නරක, හරි වැරදි, යහපත අයහපත පිළිබඳ නිගමනයකට එළඹෙයි.

ලකුණු 4 x 3 = 12



CamScanner

(iv) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවල නව ප්‍රවණතා දෙකක් පහත දැක්වේ. ඒවා ක්‍රියාත්මක වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
(අ) ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදාගැනීම
(ආ) විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම
(ලකුණු 16)

(අ) ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදා ගැනීම

- ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවල බහුලව යොදන යථාකාරී (Reality) වැඩසටහන්.
- මාධ්‍ය සංවාද වැඩසටහන් (Talk shows).
- රූපවාහිනියේ පුවත්පත් විස්තර ඉදිරිපත් කිරීමේ දී වීඩියෝ දර්ශන සහිත වීම.
- මුද්‍රිත මාධ්‍ය තුළ රූපාකාරයෙන් තොරතුරු ඉදිරිපත් කිරීම. (ඡායාරූප, කාටූන්)
- ජනකාන්ත පුද්ගලයින් මාධ්‍ය භූමිකා සඳහා භාවිත කිරීම.
- පසුතල නිර්මාණය සඳහා නූතන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම.
- භාෂා භාවිතයේ නව ප්‍රවණතා.
- ග්‍රාහක ප්‍රතිචාර මත මාධ්‍ය භූමිකාව ගොඩනැගීම.
- විවිධ තේමා යටතේ පුවත්පත් අතිරේක ප්‍රකාශයට පත් කිරීම.
- නිවේදක භූමිකාවේ නව ප්‍රවණතා.
- ශබ්දය, රූපය හා අක්ෂර භාවිතයට අදාළ නව ප්‍රවණතා.

(ආ) විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම

- විනෝදාත්මක අන්තර්ගතයන් සඳහා වැඩි අවකාශයක් වෙන් කිරීම.
- ඕපදූප හා නිල නොවන තොරතුරු සම්බන්ධයෙන්ද අවධානය යොමු කිරීම.
- සමාජ මාධ්‍ය අන්තර්ගත (Tiktok, වැනි) වැඩසටහන් මාධ්‍ය ආකෘති සඳහා යොදා ගැනීම.

උදාහරණ සහිතව ලියා ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදිය යුතුය.

උදාහරණ දැක්වීම ලකුණු $3 \times 2 = 6$

විස්තර කිරීම ලකුණු $5 \times 2 = 10$

16

5. පාසලේ සාංස්කෘතික [illegible] උත්සවයකදී සංවිධාන කමිටු සාමාජිකයෙකු ලෙස ඔබ [illegible]

(i) ඉහත අවස්ථාව සඳහා සිද්ධි කළමනාකරණය අවශ්‍ය වන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

- උත්සවයේ කාල කළමනාකරණයට.
- යෝජිත ඇස්තමේන්තුවට අනුව මූල්‍ය කළමනාකරණයට.
- උත්සවය පිළිබඳ මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට.
- තර්ජනීය තත්වයන් පාලනයට.
- උත්සවය හා සම්බන්ධ පාර්ශවකරුවන් අතර හොඳහිත වර්ධනයට.
- උත්සවයට අදාළ මානව සම්පත් කළමනාකරණයට.
- උත්සවයේ භෞතික සම්පත් කළමනාකරණයට.

ලකුණු 2 × 2 = 4

(ii) ඔබ එහි මාධ්‍ය නිලධාරියා ලෙස ක්‍රියාකරන්නේ නම් උත්සවයට පූර්ව වශයෙන් ඔබ විසින් ඉටුකළ යුතු කාර්ය දෙකක් විස්තර කරන්න. (ලකුණු 08)

- මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම හා පෙනී සිටීම.
- මාධ්‍ය සඳහා තොරතුරු සැපයීම.
- වෙබ් අඩවි, බ්ලොග්ස් ආදී නව මාධ්‍ය විධි ක්‍රම සැලසුම් කිරීම.
- අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන් දැනුවත් කිරීම.
- උත්සවයට මාධ්‍ය ආයතන කැඳවීම හා සම්බන්ධීකරණය.
- ප්‍රවර්ධන චිත්‍රපට හා දැන්වීම් යනාදිය නිර්මාණය.
- අත්පත්‍රිකා, පොත්පිංච , සඟරා, පුවත්හසුන ආදී මුද්‍රිත මාධ්‍ය සූදානම් කිරීම.
- අවශ්‍ය ඡායාරූප සකස් කිරීම.

ලකුණු 4 × 2 = 8

(iii) උසස් මාධ්‍ය සාක්ෂරතාවක් සහිත ශිෂ්‍යයෙක් බිහිකිරීම සැමරුමේ එක් තේමාවකි. ජේම්ස් පොටර්ට අනුව මාධ්‍ය සාක්ෂරතාව දියුණු කර ගැනීමෙන් ලැබෙන වාසි තුනක් විස්තර කරන්න. (ලකුණු 12)

1. විවිධ මාධ්‍ය සංදේශ ලබා ගැනීමේ කැමැත්ත වැඩිවීම.

- මාධ්‍ය බලපෑම් වලට යටත් නොවී ගුණාත්මක බවින් ඉහළ මාධ්‍යයන් සොයා ගැනීමට පෙළඹීම.
- ග්‍රාහක දැනුම අවබෝධය වැඩි දියුණු කර ගැනීමට මාධ්‍ය භාවිතය.
- විවිධ මාධ්‍ය මගින් ලැබෙන විශාල තොරතුරු ප්‍රමාණයකින් තමන්ට අවශ්‍යම තොරතුරු තෝරා ගැනීම.
- විවිධාකාරයෙන් ඉදිරිපත්වන සංදේශ අවශ්‍ය ලෙස භාවිතයට යොමු වීම.
- ග්‍රාහකයාට කැමති ලෙස මාධ්‍ය තෝරාගෙන භාවිත කිරීමට හැකිවීම.

2. මානසික චර්යා පද්ධතිය පාලනය කර ගැනීමේ හැකියාව.

- අරමුණු පෙරදැරිව කටයුතු කරන ග්‍රාහකයෙකු නිර්මාණය.
- ස්වයං සව්බලකරණය.
- ග්‍රාහකයාට, මාධ්‍ය නාලිකා පාලනය කිරීමේ හැකියාව ලැබීම.
- ග්‍රාහක අවශ්‍යතාව අනුව සංදේශ වෙන්කර ගැනීමේ හැකියාව.

3. විවිධ මාධ්‍ය සංදේශ වඩාත් විචක්ෂණශීලීව උකහා ගැනීමේ පරිචය ලබාගැනීම.

- මාධ්‍ය සංදේශයක උඩු පෙළ හා යටි පෙළ කියවා ගැනීමට හැකිවීම.
- මාධ්‍ය පරිභෝජනවාදයට හසු නොවීම.
- ග්‍රාහකයාගේ ස්වාධීන ඉලක්ක කරා යොමුවීමේ හැකියාව.
- වඩාත් යෝග්‍ය මාධ්‍ය කුමක්දැයි හඳුනා ගැනීමට හැකිවීම.

ලකුණු $4 \times 3 = 12$

(iv) පාසල පිළිබඳ බාහිර සමාජය තුළ යහපත් ප්‍රතිරූපයක් ඇතිකිරීමේදී සමාජ මාධ්‍ය මගින් ඇති කළ හැකි බලපෑම් හතරක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

- සක්‍රිය ග්‍රාහක සමාජයක් නිර්මාණය කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ප්‍රසිද්ධියක් ලබා දීම.
- පාසලේ ඉතිහාසය, දරුවන්ගේ දක්ෂතා හා ජයග්‍රහණ, කීර්තිමත් ආදි ශිෂ්‍යයින් යනාදිය පිළිබඳ තොරතුරු සමාජ ගත කිරීම.
- නිර්මාණශීලි කුසලතා එළිදැක්වීම.
- පාසල පිළිබඳව ප්‍රජාව තුළ පවතින විවිධ මත හඳුනාගෙන ඊට ධනාත්මකව ප්‍රතිචාර දැක්වීම.
- පාසලේ සංවර්ධනාත්මක ඉදිරි සැලසුම් පිළිබඳ තොරතුරු සමාජගත කිරීම.

උදාහරණ සහිතව ලියා ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ලබාදිය යුතුය.

ලකුණු $4 \times 4 = 16$

6. ජනමාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පිළිබඳ මහජන මත විමසා බැලෙන සමීක්ෂණයක දත්ත රැස් කරන්නෙක් ලෙස කටයුතු කිරීමට ඔබට අවස්ථාව ලැබී ඇත.

(i) සමීක්ෂණ භාවිතයේ වාසි දෙකක් ලියන්න. (ලකුණු 04)

- කෙටි කාලයකදී දත්ත රැස්කිරීමට හැකි වීම.
- වියදම අවම වීම.
- දුරකථන, අන්තර්ජාලය හා තැපැල භාවිතයෙන් දුර සිටින අයෙකුගෙන් වුවත් තොරතුරු රැස්කළ හැකිවීම.
- දත්ත දායකයන් විශාල සංඛ්‍යාවකින් තොරතුරු ලබාගත හැකිවීම.
- මෘදුකාංග භාවිතයෙන් හෝ ශ්‍රමායිකව (Manual) දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කළ හැකිවීම.
- වඩා විශ්වසනීය ලෙස දත්ත විශ්ලේෂණය කළ හැකිවීම.
- පුළුල් පරාසයක තොරතුරු එකවර රැස්කිරීමට හැකිවීම.
- දෝෂ අවමකරගත හැකිවීම.

ලකුණු $2 \times 2 = 4$

(ii) මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 08)

- මහජන සාමය ආරක්ෂා කිරීම
- පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කොට පවත්වාගෙන යාම.
- තාක්ෂණික ප්‍රමිතිකරණය
- විවිධ සන්නිවේදන ක්‍රමවේද ඵලදායීව භාවිතයට ගැනීම
- පොදු මහජන සන්නිවේදන ක්‍රම භාවිතයෙන් පුද්ගල අයිතීන් ආරක්ෂා කිරීම.
- විවිධත්වය හා විශ්වීය වටිනාකම් ප්‍රවර්ධනය
- සන්නිවේදනයේ නිදහස ප්‍රවර්ධනය කිරීම
- සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කරගනිමින් තොරතුරු වෙත ප්‍රවේශ වීම.
- නවෝත්පාදනය.
- තොරතුරු යනු ආර්ථික සම්පතක් බැවින් එය කළමනාකරණය කිරීම.

ලකුණු $4 \times 2 = 8$

(iii) ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිත ප්‍රවේශ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

**ස්වයං නියාමනය**

- රාජ්‍ය මැදිහත්වීමෙන් තොරව ස්වේච්ඡාවෙන් සිදු වේ.
- මාධ්‍ය හිමිකරුවන්, සංස්කාරවරුන්, ජනමාධ්‍යකරුවන් විසින් සිදු කරනු ලබයි.
- මාධ්‍ය වෘත්තිකයන්ගේ ද මැදිහත් වීම සහිතව මාර්ගෝපදේශ / ආචාර ධර්ම සකස් කරයි.
- අධීක්ෂණ කමිටු/ මණ්ඩල හා කොමිසම යනාදිය සඳහා මහජන නියෝජනය, සිවිල් සංවිධාන නියෝජනය මෙන්ම වෘත්තිකයෝ ද පර්යේෂකයෝ ද ඇතුළත් කර ගනිති.
- මාධ්‍ය ගැටලු හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කරයි.

**සහනියාමනය**

- මාධ්‍ය නියෝජිතයන්ගේ මැදිහත් වීමක් සහිතව නීත්‍යානුකූලව ස්ථාපනය කරන ලද්දකි.
- මාධ්‍ය නියෝජිතයන් යනු මාධ්‍ය හිමිකරුවන්, මාධ්‍ය සංස්කාරකවරුන් හා මාධ්‍යකරුවන්ය.
- සකස්කරගත් මාර්ගෝපදේශ හා ආචාර ධර්ම සංග්‍රහයන්ට අනුව තීන්දු හා නිර්දේශ ලබාදෙන අතර ඒවා නොසලකා හැරිය නොහැකිය.
- රාජ්‍ය මැදිහත් වීමක් සහිතය.

**ව්‍යවස්ථාපිත නියාමනය**

- නීතිය මගින් ස්ථාපිත නියාමන ක්‍රමයකි.
- සිවිල් සමාජ කණ්ඩායම්, නීතිඥ කණ්ඩායම හා ශාස්ත්‍රාලයීය පර්යේෂකයෝ මණ්ඩලයේ සාමාජිකත්වය දරති.
- දේශපාලන බලපෑම මත ස්වාධීනත්වය අහෝසි වී යා හැකිය.
- මාධ්‍ය දැඩි ලෙස පාලනය කිරීමේ හැකියාව පවතී.

**අභ්‍යන්තර නියාමනය**

- ආයතන මට්ටමින් අභ්‍යන්තරව පවත්වාගෙන යන නියාමන ක්‍රමයකි.
- පැමිණිලි පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයෙකු පත් කරගනී.
- ඔම්බුඩ්ස්මන්වරයා ලෙස පත්කර ගනු ලබන්නේ බොහෝ විට ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික මාධ්‍යවේදියෙකි.
- වෘත්තියභාවය අතින් ඉහළ මට්ටමක පවත්නා මාධ්‍ය ආයතන වලට මෙය වඩාත් යෝග්‍ය වේ.

ලකුණු $4 \times 3 = 12$



CamScanner

(iv) "සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් නියාමනය කළ යුතු ය" යන ප්‍රකාශයට පක්ෂව හා විපක්ෂව කරුණු දෙක බැගින් විස්තර කරන්න.
(ලකුණු 16)

**පක්ෂව**

- ව්‍යාජ තොරතුරු ව්‍යාප්තිය වැළැක්වීම.
- සමාජය තුළ ගැටුම් ඇතිවීම වැළැක්වීම.
- සාවද්‍ය තොරතුරු ව්‍යාප්තිය වැළැකීම.
- පුද්ගල හා ජනවර්ග වලට සිදුවන අපහාස වැළැක්වීම.
- පුද්ගල බද්ධ අදහස් ප්‍රකාශ වීම මගින් ඇතිවිය හැකි හානිය වැළැක්වීම.
- සමාජයේ ව්‍යාකුල තත්වයන් පාලනය කිරීමට හැකිවීම.
- අසභ්‍ය හා අශ්ලීල ප්‍රකාශන ජනගත වීම වැළැක්වීම.
- නෛතික තත්වයන්ට අනුකූලව සමාජය පාලනයට හැකිවීම.
- මාධ්‍යයන්ගෙන් තහවුරු කළ තිල ප්‍රකාශන ලබා ගැනීමට පෙළඹවීම.
- වෛරී ප්‍රකාශන ව්‍යාප්ත කිරීම වැළැක්වීම.
- ආචාර ධර්ම උල්ලංඝනය වීම වැළැක්වීම.
- සමාජ මාධ්‍ය තුළ ව්‍යාප්ත වන වංචනික ව්‍යාපාරවලට මග ඇහිරීම.

**විපක්ෂව**

- නිදහස් අදහස් ප්‍රකාශනයට ඇති ඉඩ සීමා වීම.
- තොරතුරු දැන ගැනීමේ නිදහස උල්ලංඝනය වීම.
- සාමාන්‍ය ජනතා හඬ යටපත් වීම.
- අධිපතිවාදී මතවාද ශක්තිමත් වීම.
- අවිධිමත් සන්නිවේදන අවස්ථා සීමා වීම.
- මාර්ගගත ව්‍යාපාර ක්ෂේත්‍ර සඳහා අවස්ථා අවහිර වීම.
- නිර්මාණශීලී චින්තනයට අවකාශය සීමා වීම.
- විකල්ප මාධ්‍ය ක්‍රියාකාරීත්වය දුර්වල වීම.
- සමාජ යථාර්ථය යටපත් වීම.

| | | |
|---|---|---|
| පක්ෂව කරුණු දැක්වීම | ලකුණු | $4 \times 2 = 8$ |
| විපක්ෂව කරුණු දැක්වීම | ලකුණු | $4 \times 2 = 8$ |
| | | 16 |

7. මධ්‍ය ප්‍රමාණයේ සංවිධිත ආයතනයක මහජන සම්බන්ධතා නිලධාරියා ලෙස සිතන්න.

(i) මහජන සම්බන්ධතා නිලධාරී භූමිකාව අභිනයේ හැඳින්වූ තනතුරු නාම දෙකක් ලියන්න. (ලකුණු 04)

- ප්‍රියන්තා, දිවැසිවරයා/ ශාස්තෘවරයා, ප්‍රචාරකයා, ප්‍රධාන උපදේශක, පෝෂක

ලකුණු $2 \times 2 = 4$

(ii) ආයතනයේ මාධ්‍ය නිලධාරියාගේ හා මහජන සම්බන්ධතා නිලධාරියාගේ කාර්යභාරය සමාන වන අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

- ආයතනය පිළිබඳ මාධ්‍ය වෙත සිදු කරනු ලබන විමර්ශන වලට පිළිතුරු ලබාදීම හා මාධ්‍ය සම්මන්ත්‍රණ, සාකච්ඡා සඳහා ආයතනය වෙනුවෙන් පෙනී සිටීම.
- මාධ්‍ය ඇගයීම් වාර්තා සකස් කිරීම, ආයතනය හා සම්බන්ධ ලිපි ලිවීම හා මාධ්‍ය වාර්තා ප්‍රකාශන බෙදා හැරීම.
- ආයතනයේ මාධ්‍ය වැඩසටහන් හා ප්‍රවර්ධන වැඩසටහන් මෙහෙයවීම.
- මාධ්‍ය ආවරණ අවස්ථා උත්පාදනය කර ගැනීම.
- ආයතනය පිළිබඳ මහජනතාව හා මාධ්‍ය අතර අවබෝධය ඇති කිරීම.
- ප්‍රවෘත්ති නිවේදන, මාධ්‍ය සාකච්ඡා, සංවිධාන කිරීම.
- රූපවාහිනී, ගුවන්විදුලි, පුවත්පත් , වෙබ් අඩවි ආදි මාධ්‍ය සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම.
- මාධ්‍ය ආවරණය සන්සන්දනාත්මකව විශ්ලේෂණය කිරීම.
- අර්බුද අවස්ථාවලදී මාධ්‍ය හා අනෙකුත් සම්බන්ධතා භාවිත කරමින් එය කළමනාකරණය කිරීම.
- මාධ්‍ය ආචාරධර්ම අනුගමනය කිරීම.

ලකුණු $4 \times 2 = 8$

(iii) ප්‍රජාව තුළ දරිද්‍රතාව අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි පියවර තුනක් විස්තර කරන්න. (ලකුණු 12)

- ස්ථිරසාර ජීවනෝපාය ඇති කිරීම.
- ව්‍යවසායික අවස්ථා වැඩි දියුණු කිරීම.
- ඵලදායී සම්පත් පරිභෝජන ප්‍රවේශ වැඩි දියුණු කිරීම.
- මූලික සමාජ සේවාවලට විශ්වීය ප්‍රවේශ සැපයීම.
- තමන්ගේම ශක්තියෙන් නැගී සිටිය නොහැකි අයට උපකාර කිරීම සඳහා වූ ප්‍රවේශ වැඩි දියුණු කිරීම.
- දරිද්‍රතාවෙන් ජීවත් වන ජනතාව හා ඔවුන්ගේ සංවිධාන බල ගැන්වීම.
- දරිද්‍රතාවය තුළ පවතින අසමානතාවයේ බලපෑමට ගොදුරු වන කාන්තාවන්ට විසඳුම් ලබාදීම.
- ජාත්‍යන්තර සහයෝගිතාව ශක්තිමත් කිරීම.
- අධ්‍යාපන පහසුකම් තහවුරු කිරීම.

ලකුණු $4 \times 3 = 12$

(iv) සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදාගත හැකි ආකාරය පහත කරුණු ඔස්සේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
(අ) අවශ්‍යතා කේන්ද්‍රියතාව
(ආ) යහපත් පරිසරයක් ගොඩනැගීම (ලකුණු 16)

(අ) අවශ්‍යතා කේන්ද්‍රියතාව

මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා පහසුකම් හා සේවා ගොඩනැගීමට සන්නිවේදනය යොදා ගැනීම.

- සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම.
- පෝෂණ අවශ්‍යතා සවිබල ගැන්වීම.
- සනීපාරක්ෂක පහසුකම් හා සේවා විධිමත් කිරීම.
- මානව හිමිකම් තහවුරු කිරීම.
- නවාතැන් අවශ්‍යතා සපුරාලීම.
- අධ්‍යාපනික අවශ්‍යතා වැඩි දියුණු කිරීම.
- උසස් රසවින්දන අවස්ථා සැලසීම.

(ආ) යහපත් පරිසරයක් ගොඩනැගීම

පරිසර විද්‍යාත්මක සමබරතාවය ගොඩනැගීම. (ජෛවගෝලීය සමතුලිතතාවය ඇති කිරීම)

- සියලුම ජීවීන්ගේ පැවැත්මට ප්‍රමාණවත් ආහාර ලබා ගැනීම හා ඔවුන්ගේ ස්ථාවරත්වය ගොඩනැගීම.
- සම්පත් සූරාකෑම වැළැක්වීම.
- වනාන්තර විනාශය වැළැක්වීම.
- රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආපදා සන්නිවේදන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම.
- යුක්තිය හා සාධාරණත්වය ඇති කිරීම.

ඉහත කරුණු තුළින් සංවර්ධනය සඳහා, සන්නිවේදනය භාවිත කළ ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කළ යුතුය.

| | | |
|---|---|---|
| උදාහරණ දැක්වීම | ලකුණු | $3 \times 2 = 6$ |
| විස්තර කිරීම | ලකුණු | $5 \times 2 = 10$ |
| | | 16 |

*******

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI
Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!
CamScanner